සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	10	ගෘහ ආර්ථික විද්‍යාව - I	කාලය / நேரம் / Time	පැය 03යි.

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

---

1. කිරි සහ කිරි ආහාරවල අඩංගු ඩයිසැකරයිඩයකි.
   (1) ලැක්ටෝස් (2) සුක්‍රෝස් (3) මෝල්ටෝස් (4) ගැලැක්ටෝස්

2. සිරුර තුළ නිපදවාගත නොහැකි අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ලය කුමක් ද?
   (1) සෙයින් (2) පෙක්ටීන් (3) වැලින් (4) ඔමේගා

3. මේදයේ ද්‍රව්‍ය විටමින දෙකකි,
   (1) විටමින් B හා A (2) විටමින් E හා K (3) විටමින් K හා C (4) විටමින් B හා D

4. ප්‍රෝටීනවල කෘත්‍යයක් නොවන්නේ,
   (1) එන්සයිම නිෂ්පාදනය (2) හෝර්මෝන නිෂ්පාදනය
   (3) ප්‍රතිදේහ නිෂ්පාදනය (4) ස්නේහකයක් ලෙස ක්‍රියා කිරීම.

5. “ආහාර ගබඩාකර තැබීමේ දී එහි ගුණාත්මක ලක්ෂණ කෙරෙහි බලපාන සාධකයකි ආර්ද්‍රතාවය.” ආර්ද්‍රවතාව යනු,
   (1) වාතයේ අඩංගු ඔක්සිජන් ප්‍රමාණයයි. (2) ආහාරයේ අඩංගු ජල ප්‍රමාණයයි.
   (3) එක් එක් ආහාරයට අවශ්‍ය උෂ්ණත්ව ප්‍රමාණයයි. (4) වාතයේ අඩංගු ජල වාෂ්ප ප්‍රමාණයයි.

6. පහත දැක්වෙන වැකි අතරින් සාවද්‍ය වැකිය තෝරන්න.
   (1) පෝෂණ වගුව ආහාර වේල් සැලසුම් කිරීමේදී මග පෙන්වන මූලාශ්‍රයකි.
   (2) දෛනික පෝෂණ අවශ්‍යතාව තීරණය කිරීමේදී නිර්ණායකයක් ලෙස සිරුරේ බර සැලකිල්ලට ගෙන ඇත.
   (3) දෛනික පෝෂණ අවශ්‍යතා සටහනෙහි මහා පෝෂක දක්වා ඇත්තේ මිලි ග්‍රෑම්වලිනි.
   (4) තන්තුමය ආහාර, ආහාර වේලට එක් කර ගැනීම ආන්ත්‍රික පිළිකා වළක්වා ගත හැක.

7. පෝෂණය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) මස්වල අඩංගු වන්නේ අසංතෘප්ත මේදයයි.
   (2) සිරුර තුළ විටමින් D නිෂ්පාදනය කළ හැකිය.
   (3) වැඩිපුර විටමින් C ලබා ගැනීම සිරුරට විෂ සහිත වේ.
   (4) අක්මාව තුළ ප්‍රෝටීන තැන්පත් කරයි.

8. සංවහනය ප්‍රධාන වශයෙන් සිදු වන්නේ පහත දැක්වෙන කුමන පිසීමේ ක්‍රියාවලියෙන් ද?
   (1) පාන් ටෝස්ට් කිරීමේදී ය. (2) පෑන් කේක් පිසීමේදී ය.
   (3) මුං කැවුම් බැදීමේදී ය. (4) මස් ග්‍රිල් කිරීමේදී ය.

Past Papers Wiki

9. ක්ෂුද්‍ර ජීවී වර්ධනය සඳහා අවශ්‍ය බාහිර සාධකයකි.

(1) ඔක්සිජන් (2) ජල සක්‍රියතාව (3) PH අගය (4) උපස්තරය

10. තයිරොයිඩ් ග්‍රන්ථියෙන් ශ්‍රාවය කරන හෝර්මෝනය කුමක් ද?

(1) ඇඩ්‍රිනලීන් (2) තයිරොක්සින් (3) ඔක්සිටොසින් (4) ප්‍රොලැක්ටීන්

11. ක්වෝෂියෝකෝර් රෝගයට ලක් වූ දරුවකු තුළින් දැකිය හැකි රෝග ලක්ෂණයකි.

(1) කෘශ වූ ශරීරයක් පැවතීම. (2) සම වියළීම සහ රැළි වැටීම.

(3) හිස කෙස් සිනිඳු වීම. (4) මුහුණ, අත්, පා ඉදිමී තිබීම.

12. පෝෂණ නිරක්තිය ඇති වීමට හේතුවකි,

(1) අධික රක්තපාතය

(2) පණු ආසාදන (කොකු පණු වැනි)

(3) රතු රුධිරාණු නිපදවීමට අඩංගු යකඩ විටමින් C වැනි පෝෂක සිරුරට නොලැබීම.

(4) ආර්ථවයේදී සිදුවන අධික රුධිර වහනය

13. පහත දැක්වෙන්නේ විටමින් වර්ගයක් පිළිබඳ පෝෂණවේදී වෛද්‍යවරයෙකුගේ දේශනයකින් උපුටා ගත් ප්‍රකාශ කිහිපයකි.

A - රුධිරය කැටි ගැසීමේ කාරකය වන ප්‍රොත්‍රොම්බින් නිපදවීමට අවශ්‍ය වේ.
B - ඌනතාව හේතුවෙන් අලුත උපන් බිළිඳුන් තුළ රක්තපාත තත්ත්වයක් ඇති වේ.
C - අන්ත්‍ර තුළට පිත් යුෂ ගලා යාම අඩු වීමෙන් මෙම විටමිනය අවශෝෂණයට බාධා ගෙන දේ.

මෙකී විටමිනය වන්නේ,

(1) විටමින් C ය. (2) විටමින් A ය. (3) විටමින් K ය. (4) විටමින් B_2 ය.

14. ආහාරයේ ගුණාත්මක ලක්ෂණ දියුණු කිරීමට ආහාරවලට ආකලන බාහිරව එකතු කරනු ලැබේ.

E 100 න් දැක්වෙන්නේ,

(1) පරිරක්ෂකකාරකයකි. (2) වර්ණකයකි.

(3) පිපුම්කාරකයකි. (4) කෘතිම පැණිරස කාරකයකි.

15. එළවළුවලට ආවේණික ස්වභාවික වර්ණකයක් වන කැරොටිනොයිඩ් අඩංගු වන්නේ,

(1) රතු, දම් එළවළුවල ය. (2) සුදු පැහැ එළවළුවල ය.

(3) කොළ පැහැති එළවළුවල ය. (4) කහ තැඹිලි පැහැ එළවළුවල ය.

16. ක්ෂීරණ මවකට මුල් මාස 6 තුළදී එකතු කළ යුතු කැලරි ප්‍රමාණය වන්නේ,

(1) කිලෝ කැලරි 675කි.
(2) කිලෝ කැලරි 460කි.
(3) කිලෝ කැලරි 360කි.
(4) කිලෝ කැලරි 47කි.

17. ශීතකරණයක අධිශීතන කලාපයේ ගබඩා කළ යුතු ආහාර වන්නේ,

(1) හිම කිරණ, බටර් හා කිරි (2) මස්, මාළු, බිත්තර

(3) මාළු, තම්බන ලද ඇට වර්ග (4) බටර්, කිරි, බිත්තර

18. මුල් යොවුන් වියට අයත් කාලසීමාව වනුයේ,

(1) අවුරුදු 10 - 13 (2) අවුරුදු 10 -15 (3) අවුරුදු 10 - 14 (4) අවුරුදු 10 -16

Past Papers Wiki

19. නව යෞවන අවධිය පිළිබඳ සටහනකින් උපුටා ගත් කරුණු කිහිපයක් පහත දැක්වේ. මේ කරුණු අතුරෙන් සාවද්‍ය පිළිතුර තෝරන්න.

(1) අත් පා, කඳට වඩා වේගයෙන් වර්ධනය වේ.

(2) අස්ථි ඝනත්වයෙන් වැඩි වේ.

(3) ශරීර කොටස් අතර අනුපාතය සමාන වේ.

(4) ගැහැණු ළමුන්ගේ මේද පටක ද, පිරිමි ළමුන්ගේ පේශි පටක ද වර්ධනය වැඩි වේ.

20. ස්ත්‍රී ප්‍රජනක පද්ධතියට අයත් අවයවයක් වන ඩිම්බකෝෂ මගින් කෙරෙන කාර්යයක් නොවන්නේ,

(1) ඩිම්බ පරිණත වීම. (2) ඩිම්බහරණය

(3) ස්ත්‍රී ප්‍රජනක හෝමෝන නිෂ්පාදනය (4) ඩිම්බ පරිවහනය

21. සෑම ගර්භනී මවක්ම අපේක්ෂා කරන්නේ නිරෝගී දරු උපතකි. නමුත් අක්‍රමිකතා සහිත දරුවන් හා ප්‍රසූතියේ දී සංකූලතා ඇතිවන මව්වරු ද ඇත. මෙම තත්ත්වයන්ට ගොදුරු නොවන මව වන්නේ,

(1) අවුරුදු 38 වයසැති මවය. (2) අවුරුදු 25 වයසැති මවය.

(3) අවුරුදු 13 වයසැති මවය. (4) 130 cm උසැති මවය.

22. සාමාන්‍ය කාන්තාවකට වඩා ගර්භණී අවධියේදී ශක්ති අවශ්‍යතාව වැඩිය. ඒ අනුව දෙවැනි ත්‍රෛමාසිකයේ දී වැඩිපුර අවශ්‍ය වන ශක්ති ප්‍රමාණය කිලෝ කැලරි කීයද?

(1) කි.කැලරි 750 (2) කි.කැලරි 475 (3) කි.කැලරි 360 (4) කි.කැලරි 800

23. ගර්භනී අවධියේදී විශේෂයෙන් සමහර පෝෂකවල වැඩි දෛනික අවශ්‍යතාවයක් ඇත. එහෙත් එම පෝෂක අතුරෙන් සාමාන්‍ය කාන්තාවකට හා සමානවම අවශ්‍යතාවයක් ඇති පෝෂකය කුමක්ද?

(1) ප්‍රෝටීන් (2) කැල්සියම් (3) සින්ක් (4) යකඩ

24. ගර්භනී සමයේ දී; B කාණ්ඩයේ විටමිනයක් වන ෆෝලේට්වල අවශ්‍යතාව ඉතා ඉහළ අගයක් ගන්නේ පහත සඳහන් කුමන කරුණක් නිසා ද?

(1) කලල වර්ධනය ආරම්භයේ සිටම ස්නායු සෛල නිර්මාණය වන නිසාය.

(2) මන්දමානසික දරු උපත් ඇතිවීම වැළැක්වීමට අවශ්‍ය නිසාය.

(3) මළ දරු උපත් ඇතිවීමේ අවධානම අඩු කරන නිසාය.

(4) ගබ්සා වීම් ඇති නොවීමට බලපාන නිසාය.

25. ගර්භනී අවධියේ ඇතිවන අවදානම් සාධකයක් නොවන්නේ,

(1) සමාජ රෝග (2) ඇඳුම රෝගය (3) සංජානීය රෝග (4) වමනය

26. ගර්භනී මවකට ප්‍රසූතියේ දී ඉතා ඉක්මනින් රුධිරය ලබාදීමට අවශ්‍ය වුවහොත් එයට පිටිවහලක් වනුයේ කුමන රුධිර පරීක්ෂණය ද?

(1) හිමොග්ලොබින් පරීක්ෂණය (2) රුධිර ඝන පරීක්ෂණය

(3) රිසස් සාධක පරීක්ෂණය (4) VDRL පරීක්ෂණය

27. ගර්භාෂයේ ඇතුළු ආස්තරය හඳුන්වන්නේ කෙසේද?

(1) එන්ඩෝ මෙට්‍රියම (2) මොරියුලාව (3) අධිරෝපණය (4) අන්තඃවිභජනය

28. නිර්මාණයකින් ඉටුවිය යුතු කාර්යය නිසි පරිදි ඉටුවන සේ සැකසී තිබීම හඳුන්වන්නේ කෙසේද?

(1) සජීවී බව (2) ක්‍රියාශීලී බව (3) නිර්මාණාත්මක බව (4) ක්‍රියානුරූපී බව

29. අක් සැරසිල්ලක් නොවන්නේ මින් කුමක්ද?

(1) රේන්ද ඇල්ලීම (2) පයිපින් කිරීම (3) එළලීම් කිරීම (4) බදන යෙදීම

30. විසිතුරු මැහුම් මැසීම සඳහා වඩාත්ම සුදුසු නූල් වර්ගය වනුයේ,

(1) කපු කැරලි නූල් (2) සිල්ක් කැරලි නූල් (3) වර්ණවත් නූල් (4) වර්ණවත් පන්දු නූල්

31. මුද්‍රිත රෙද්දක ඇති මෝස්තර හෝ තනි පැහැ රෙද්දක් මත අඳින ලද මෝස්තර වෙනත් රෙද්දක් මත තබා මැසීම හඳුන්වන්නේ,

(1) අණ්ඩ දැමීම (2) ඇඳුම් අලුත්වැඩියාව (3) ආරෝපණය කිරීම (4) බයින්ඩින් කිරීම

32. මූලික මැහුම් ක්‍රම හා මැසීමේ ශිල්පීය ක්‍රම මැසීම සඳහා යොදාගන්නා රෙදි නියැදිවල උස හා පළල පිළිවෙළින් දැක්වෙන වරණය වනුයේ,

(1) 12cm x 12cm (2) 10cm x 12 cm (3) 10 cm x 10cm (4) 12cm x 10 cm

33. කෘත්‍රිම කෙඳි වර්ගයකට අයත් නොවන්නේ මින් කුමක්ද?

(1) නයිලෝන් කෙන්ද (2) නියඳ කෙන්ද (3) ටෙරලින් කෙන්ද (4) ඕර්ලෝන් කෙන්ද

- ළදරු ඇඳුම මැසීමේ පියවර කිහිපයක් පහත දැක්වේ.

A - කර මැසීම C - විවරය මැසීම
B - අත් කට මැසීම D - වාටිය මැසීම

34. ළදරු ඇඳුම මැසීමේ අනුපිළිවෙළ දැක්වෙන වරණය කුමක්ද?

(1) C, A, B, D ය. (2) A, B, C, D ය. (3) B, C, A, Dය. (4) C, B, A, D ය.

35. ළදරු ඇඳුම් නිර්මාණය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වනුයේ,

(1) විස්කෝස් හා පොප්ලීන් රෙදි භාවිත කළ හැකි වේ.
(2) සිරුරේ හැඩයට අනුකූල විය යුතු වේ.
(3) මූට්ටුවක් යොදන්නේ නම් විවෘත පැතලි මූට්ටුව යෙදිය යුතු වේ.
(4) සරල, විසිතුරු මෝස්තර යෙදිය යුතුවේ.

36. පවුලේ අවශ්‍යතා පිළිබඳව ශිෂ්‍යාවක විසින් ලියන ලද සටහනකින් උපුටාගත් ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - ඇඳුම් පැළඳුම් හා සෞඛ්‍ය පහසුකම් කායික අවශ්‍යතා වේ.

B - "අන්‍යෝන්‍ය සහයෝගය" මානසික අවශ්‍යතාවයක් මෙන්ම සමාජයීය අවශ්‍යතාවයකි.

C - නිවාස, අධ්‍යාපනය හා පරිත්‍යාගශීලී බව භෞතික අවශ්‍යතාවන් සඳහා උදාහරණ වේ.

මෙම ප්‍රකාශ අතුරින් සාවද්‍ය පිළිතුර හෝ පිළිතුරු වනුයේ,

(1) A හා C ය. (2) B හා C ය. (3) C පමණි. (4) B පමණි.

37. නිවසේ පවතින විශාලත්වයෙන් අඩුම කාමරයේ අවම ප්‍රමාණය වර්ග අඩි කීයද?

(1) වර්ග අඩි 100කි. (2) වර්ග අඩි 90කි. (3) වර්ග අඩි 80කි. (4) වර්ග අඩි 120කි.

38. නිවසක බිම් සැලසුම් නිර්මාණය කිරීමේ දී මෙන්ම නිවෙස සංවිධානයේදී දොර හා ජනේල පිහිටුවීම පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වනුයේ කුමක්ද?

(1) හිරු නැගීමේ හා බැසීමේ දිශාවන්ට අනුකූලව දොර හා ජනේල පිහිටුවීම.
(2) දොර පියන් කාමරය තුළට විවෘතවන ලෙසට යෙදීම.
(3) හරස් සංවාතනය සඳහා සමාන්තර බිත්තිවල දොර ජනේල පිහිටුවීම.
(4) නිදන කාමරවල ජනෙල් පියන් සඳහා පාරදෘශ්‍ය විදුරු යෙදීම.

39. භෞතික සම්පතක් හා භෞතික නොවන සම්පත් පිළිවෙළින් දැක්වෙනුයේ,

(1) ජලය හා විදුලිය (2) විදුලිය හා මුදල් (3) ඉන්ධන හා ජලය (4) කාලය හා විදුලිය

40. "විවිධ කාර්යයන්හි නිරතවීම සඳහා පුද්ගලයෙකු සතු හැකියාව හඳුන්වන්නේ කෙසේද?"

(1) ශ්‍රමය ලෙසිනි. (2) කුසලතා ලෙසිනි. (3) ආකල්ප ලෙසිනි. (4) දැනුම ලෙසිනි.

PAST PAPERS WIKI
WWW.PastPapers.WIKI

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	10	ගෘහ ආර්ථික විද්‍යාව - II	කාලය நேரம் Time

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

- පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

---

1) සියාරාගේ සැමියා ව්‍යාපාරිකයෙකි. පස් මස් ගැබිණියක් වූ ඇය වෘත්තියෙන් මෘදුකාංග ඉංජිනේරුවරියකි. ඇගේ දියණියගේ වයස අවුරුදු හතරකි. අවුරුදු 70 පමණ වියපත් ඇයගේ මව ද ඔවුන් සමඟ දිවි ගෙවයි. නිවසේ දානමය කටයුත්තක පෙර දින බැවින් මෙදින ඔවුනට කාර්ය බහුල දිනයකි.

1. මෙම පවුල අයත් පවුල් වර්ගය නම් කරන්න.
2. මෙකී පවුලේ සාමාජිකයන්ගේ මානසික අවශ්‍යතා දෙකක් ලියන්න.
3. දියණියට පෙර පාසලට ගෙන යාම සඳහා සුදුසු බොජුන් පතක් ලියන්න.
4. දානමය අවස්ථාව සඳහා පෙර දින සකස් කර තැබිය හැකි පරිරක්ෂිත ආහාර වර්ග දෙකක් ලියන්න.
5. දානය සඳහා බටර් කේක් සෑදීමට අවශ්‍ය අමුද්‍රව්‍ය හතරක් ලියන්න.
6. සියාරාගේ මව ඔස්ටියෝ මැලේෂියා රෝගයෙන් පසුවන්නියකි. ඇයට සුදුසු කැල්සියම් බහුල ආහාර වර්ග දෙකක් ලියන්න.
7. මෙම නිවසෙහි ඉඩකඩ පිරිමැසිය හැකි ගෘහ භාණ්ඩ දෙකක් සඳහන් කරන්න.
8. මෙම පවුලෙහි මානව සම්පත් දෙකක් නම් කර ඊට උදාහරණ දෙකක් දෙන්න.
9. නිවස අලංකාර කර ගැනීමට භාවිත කළ හැකි උපාංග හතරක් ලියන්න.
10. ළදරුවා සඳහා නිර්මාණය කරන ළදරු ඇඳුමේ වාටිය අලංකාර කර ගැනීමට සුදුසු ක්‍රම දෙකක් ලියන්න.

2) (i) ළදරු ඇඳුම් මැසීම සඳහා යොදා ගත හැකි ශිල්පීය මැහුම් ක්‍රම තුනක් උදාහරණ සහිතව දක්වන්න. (ල. 03)

(ii) විකර්ණාකාර පටියක් කපා මසා ගන්නා අයුරු රූප සටහන් මගින්, පියවර තුනක් යටතේ දක්වන්න. (ල. 03)

(iii) කපු රෙදි වෙනත් රෙදිවලින් වෙන් කොට හඳුනා ගැනීම සඳහා යොදාගත හැකි සරල පරීක්ෂණ හතරක් නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ල. 04)

3) (i) පොලි සැකරයිඩ තුනක් නම් කර ඒ සඳහා උදාහරණ එක බැගින් ලියන්න. (ල. 03)

(ii) ආහාර වේල් සැලසුම් කිරීමේදී සැලකිය යුතු කරුණු තුනක් ලියන්න. (ල. 03)

(iii) ප්‍රෝටීන පරිපූරණය යන්න පැහැදිලි කර එක් උදාහරණයක් දෙන්න. (ල. 04)

PAST PAPERS WIKI

Past Papers Wiki

4) (i) ආහාර නරක් වීමට බලපාන හේතු තුනක් දක්වන්න. (ල. 03)

(ii) විටමින් C ඌනතාවයෙන් වැළඳෙන ඌනතා රෝගය නම් කර රෝග ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 03)

(iii) ආහාර පිසීමේ ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න. (ල. 03)

5) (i) පවුල" යන්න නිර්වචනය කරන්න. (ල. 03)

(ii) ප්‍රසන්න ජීවන පරිසරයක් ඇති කර ගැනීම සඳහා අවට පරිසරය, පරිසර දූෂණයෙන් තොරවීම විශාල ලෙස බලපායි. එබඳු පරිසරයක තිබිය යුතු ලක්ෂණ තුනක් ලියන්න. (ල. 03)

(iii) පහත සඳහන් දත්ත සැලකිල්ලට ගනිමින් නිදන කාමරයක් සඳහා සුදුසු දළ බිම් සැලැස්මක් අඳින්න.

- කාමරයේ ප්‍රමාණය වර්ග අඩි 90යි. (10' x 9')
- අඩි 09 බිත්තියේ පියන් දෙකක ජනේලයකි.
- අඩි 10 බිත්තියේ දොර පිහිටා ඇත. (ල. 04)

6) (i) a. "ප්‍රාථමික ලිංගික ලක්ෂණ" හා "ද්විතීයික ලිංගික ලක්ෂණ" යන්න හඳුන්වන්න. (ල. 03)

b. ස්ත්‍රී හා පුරුෂ දෙපාර්ශවයටම පොදු වූ ද්විතියික ලිංගික ලක්ෂණ දෙකක් ලියන්න.

(ii) මෙම ද්විතීයික ලිංගික ලක්ෂණ පිළිබිඹු කිරීම පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වන අතර, ඇතැම් විට නිශ්චිත වයසක දී පෙන්නුම් නොකිරීමටද පුළුවන. එලෙස වීමට බලපාන හේතු තුනක් සඳහන් කරන්න. (ල. 03)

(iii) නව යෞවන අවධියේ ඇතිවන මානසික වර්ධනය, බාහිරව පෙන්නුම් කරන ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ල. 04)

7) (i) පූර්ව ප්‍රසව සංවර්ධනය තුළ සිදුවන වර්ධන අවස්ථා නම් කරන්න. (ල. 03)

(ii) ගර්භනී භාවයේ ලක්ෂණ හතරක් නම් කර ඉන් එකක් ඇතිවීමට බලපාන හේතු සඳහන් කරන්න. (ල. 03)

(iii) ස්ත්‍රී ප්‍රජනක පද්ධතියේ දළ රූප සටහනක් ඇඳ කොටස් නම් කරන්න. (ල. 04)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library